ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව – තුන්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2023/2024

LLU3703 - ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ හැඳින්වීමක්

කාලය – පැය 03

දිනය : 2025 මැයි 14 — වේලාව : ප.ව 1.30 – ප.ව 4.30

මුළු ප්‍රශ්න ගණන – 08

ප්‍රශ්න 05 (පහකට) පමණක් පිළිතුරු ලියන්න

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1) තරුණ ආසියානු පර්යේෂකයින් සඳහා වූ වාර්ෂික පර්යේෂණ සම්මේලනයේදී "ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට ඉංග්‍රීසි නීතියේ බලපෑම" යන මාතෘකාව යටතේ දේශනයක් පැවැත්වීමට ආරාධනා කර ඇති ඔබ, ශ්‍රී ලංකාවේ කීර්තිමත් නීතිය පිළිබඳ පර්යේෂකයෙකු යැයි සිතන්න.

ශ්‍රී ලංකාවේ නීති ක්ෂේත්‍රයට ඉංග්‍රීසි නීතියේ බලපෑම පෙන්නුම් කරමින් ඔබේ දේශනය සඳහා සවිස්තරාත්මක දළ සටහනක් අදාල නඩුතීරණ, ප්‍රඥප්ති සහ අනෙකුත් නීති රාමු ඇතුළත් කරමින් සකස් කරන්න.

(ලකුණු 20)

2) උඩරට නීතියට යටත් පුද්ගලයකු වූ බණ්ඩාර 1980 ජනවාරි 2 වැනිදා උඩරට නීතියේ විධිවිධාන අනුව රන් මැණිකා සමඟ විවාහ විය. මෙම යුවළට එම විවාහයෙන් දරුවන් දෙදෙනෙකු ලැබුණි. කෙසේ වෙතත්, 1985 ජූලි මාසයේදී, එම විවාහය පවතින අතරතුර, බණ්ඩාර ඉස්ලාම් ආගමිකයෙකු බවට පත්විය. එම ආගම වැළඳගත් පසු, බණ්ඩාර කුසුමා සමඟ දෙවන විවාහයක් කර ගැනීමට තීරණය කළේය. ඉන්පසුව, 1991 සැප්තැම්බර් මාසයේදී ඔහු ෆාතිමා සමඟ ඔහුගේ තුන්වන විවාහය සිදු කළේය.

මෙම තත්ත්වය හේතුවෙන් මුස්ලිම් නීතිය යටතේ බණ්ඩාරගේ දෙවන සහ තුන්වන විවාහයේ වලංගුභාවය සම්බන්ධයෙන් නීතිමය ප්‍රශ්න කිහිපයක් මතු වී තිබේ.
ඉහත සඳහන් සාධක විශ්ලේෂණය කර මුස්ලිම් නීතිය යටතේ දෙවන සහ තුන්වන විවාහවල වලංගුභාවය පැහැදිලි කරන්න.

ඔබගේ පිළිතුර අදාල ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු නීතිය ඇසුරෙන් පහදන්න.

(ලකුණු 20)

3) ශ්‍රී ලංකාවේ නීතිමය රාමුව තුළ විවාහය, උරුමය සහ දේපළ අයිතිවාසිකම් ඇතුළු පවුල් ජීවිතයේ විවිධ අංශ පාලනය කරන බහු පුද්ගල නීති ඇතුළත් වේ. මෙම පුද්ගලික නීති විවිධ ආගමික, සංස්කෘතික සහ ජනවාර්ගික සම්ප්‍රදායන්ගෙන් බලපෑම් මගින් බිහිවී ඇත. එකී ආගමික සංස්කෘතික හා ජනවාර්ගික සම්ප්‍රදායන් මගින් එකී ප්‍රජාවන්ගේ අවශ්‍යතාවයන් ඓතිහාසිකව සපුරාලූ අතර, මෑත කාලීන සමාජ හා සංස්කෘතික වර්ධනයන් විසින් ඇතැම් ක්ෂේත්‍රවල ප්‍රතිසංස්කරණ සඳහා ඇති අවශ්‍යතාවය ඉස්මතු කර තිබේ.

ශ්‍රී ලාංකික සමාජයේ ගතික ස්වභාවය අනුව, පුද්ගල නීති තුළ ඇති ඇතැම් විධිවිධාන යල් පැන ගිය ඒවා ලෙස පෙනෙන අතර ඒවා තුළ සමාජීය හරයන් තවදුරටත් පිළිබිඹු නොවේ. මෙම වර්ධනයන් සලකා බැලීමේදී, එකී නීති සමකාලීන සමාජ වෙනස්කම්වලට අනුගතවෙමින් යුක්තිය, සමානාත්මතාවය සහ මානව අයිතීන් පිළිබඳ මූලධර්ම පිළිගැනීම සඳහා ඒවායේ විෂය ක්ෂේත්‍රවල ක්ෂණික වෙනස්කම් කිරීමේ අවශ්‍යතාවය මතු වී ඇත.

ශ්‍රී ලංකාවේ පුද්ගලික නීති තුළ ක්ෂණිකව වෙනස් කළ යුතු ප්‍රධාන කරුණු තුනක් හඳුනාගෙන විශ්ලේෂණය කරන්න.
අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු නීති ඇසුරෙන් ඔබේ පිළිතුර පහදන්න.

(ලකුණු 20)

4) ප්‍රියන්ත යනු මාතලේ කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකි. ගම්පොළ පාරම්පරික උඩරට ගොවියෙකු වන කිරි බණ්ඩා සහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචි චන්ද්‍රානි යන අයගේ එකම දරුවා ඔහුය. කිරි බණ්ඩා සහ චන්ද්‍රානි 1948 වර්ෂයේදී උඩරට නීති ප්‍රකාරව විවාහ විය.
මාතලේ සේවය කරන අතරතුර, ප්‍රියන්තට කීර්තිමත් ජාතික විද්‍යාලයක විද්‍යා ගුරුවරියක් වන සෙනුරි මුණගැසුණි. වසර දෙකක සම්බන්ධතාවයකින් පසු, ඔවුන් විවාහ වීමට තීරණය කළහ. සෙනුරි නුගේගොඩ පදිංචි වී සිටි අතර, ඇගේ දෙමාපියන් පහතරට සිංහල ජාතිකයන් වන බැවින්, ශ්‍රී ලංකාවේ පොදු නීතිය මගින් පාලනය වේ.

විවාහය ළං වන විට, විවාහය ලියාපදිංචි කළ යුත්තේ කුමන නීතියක් යටතේද යන්න තීරණය කිරීමට පවුල් දෙකම යුහුසුළු විය. ප්‍රියන්තගේ දෙමව්පියන් ස්වකීය උරුමය සහ පවුලේ අනන්‍යතාවයට අනුකූලව, එම විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කිරීමට බලකර සිටිති. එහෙත් එයට ඉඳුරාම වෙනස් මතයක් දක්වමින් , සෙනුරිගේ දෙමව්පියන් එම විවාහය සාමාන්‍ය විවාහ ආඥා පනත යටතේ ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන්නේ, ඔවුන්ගේ පවුල උඩරට සිරිත් විරිත් අනුගමනය නොකරන බැවින් සහ සාමාන්‍ය නීතිය වඩාත් නවීන සහ ප්‍රශස්ත නීති පද්ධතියක් වන බැවිනි.
ප්‍රියන්ත සහ සෙනුරි, උඩරට නීතිය යටතේ තම විවාහ ලියාපදිංචි කිරීමට හැකියාවක් තිබේද යන්න දැනගැනීමට කැමැත්තෙන් සිටිති.

(අ) උඩරට නීතිය යටතේ ඔවුන්ගේ විවාහය ලියාපදිංචි කිරීමේ හැකියාව පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

(ආ) ප්‍රියන්තගේ පියා පහතරට සිංහල ජාතිකයෙකු නම් සහ ඔහුගේ මව උඩරට කාන්තාවක් ලෙස 1948 දී බින්න විවාහයකට ඇතුළත් වී සිටියා නම්, ඉහත (අ) කොටස සඳහා ඔබ ලබා දී ඇති පිළිතුර කෙසේ වෙනස්වන්නේද ?

**(ලකුණු 10)**

5) ශ්‍රී ලංකාවේ පුද්ගලික නීතිවල අදාලත්වය සම්බන්ධයෙන් පහත දක්වා ඇති ප්‍රචලිත නඩු අතරින් දෙකක් තෝරාගන්න. එලෙස තෝරාගන්නා ලද නඩුතීන්දුව පිළිබඳව එහි අදාළ නෛතික ගැටළු විස්තර කරමින් නඩු තීන්දුවේ හරය (*ratio decidendi*) පිළිබඳ විශ්ලේෂණය කරන්න.

(අ) *නටාලි මානෙල් අබේසුන්දර එදිරිව ක්‍රිස්ටෝපර් අබේසුන්දර* (1988) 1 SLR 185
(ආ) *විලියම්ස් එදිරිව රොබට්සන්* (1886) 8 SCC 36
(ඇ) *සිවඥානලිංගම් එදිරිව සුනේතලිංගම්* (1988) 1 SLR 86
(ඈ) *අබ්දුල් කාදර් එදිරිව රාසික්* (1950) 52 NLR 156

**(ලකුණු 10x2 = 20)**

6) 1970 දී ත්‍රිකුණාමලයේ ද්‍රවිඩ ජාතික දෙමව්පියන්ට දාව ගනේෂ් උපත ලැබීය. වයස අවුරුදු පහේදී ඔහුගේ පවුල යාපනයට පදිංචියට ගිය අතර එහිදී ඔහු ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ලැබීය. වයස අවුරුදු 18 දී පාසල් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු, ගනේෂ් යාපනයේ රැඳී සිටිමින් ඔහුගේ මාමාගේ ගොවිපළේ වැඩ කරමින් එහි දිගටම පදිංචි වී සිටියේය.

1995 දී ගනේෂ්, යාපනයේ දෙමළ කාන්තාවක් වන රාධා සමඟ විවාහ විය. 2001 දී රාධා හදිසියේ මිය යන තුරුම මෙම යුවළ ගොවිපලෙහි ජීවත් වෙමින් එහි වැඩ කළහ. රාධාගේ මරණයෙන් පසු, ගනේෂ් මහනුවරට ගොස් තේ වත්තක රැකියාවක් ලබා ගත්තේය. 2002 දී ඔහු එම වත්තේම සේවය කළ කමලිනී නම් කාන්තාවක් සමඟ විවාහ විය. විවාහයෙන් පසු ගනේෂ් සහ කමලිනී මහනුවර පදිංචි වූහ.

2003 දී, ගනේෂ් යාපනයෙන් නිවසක් මිලදී ගෙන ඔහුගේ මහලු දෙමාපියන්ට එහි පදිංචි වීමට ආරාධනා කළේය. තවද ඔහු දෙමව්පියන් වෙත දන්වා සිටියේ යාපනයේ ස්ථිරව පදිංචි වීමට ඔහුට අදහසක් පවතින බවයි. කෙසේ වෙතත්, 2006 දී, ඔහු යාපනයේ පදිංචි වීමට පෙර, අනපේක්ෂිත ලෙස මිය ගියේය.

ගනේෂ් පාලනය වන්නේ තේසවලාමෙයි නීතිය මගින්ද නැතහොත් සාමාන්‍ය නීතිය මගින්ද යන්න පිළිබඳව කමලිනී ඔබෙන් උපදෙස් පතයි.

ඔබේ පිළිතුර අදාල ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීරණ ඇසුරෙන් පහදන්න

**(ලකුණු 20)**

7) " … මෙම ව්‍යවස්ථා (බතාවියානු ව්‍යවස්ථා) ඕලන්දයේ නීතිවිද්‍යාව වෙනස් කරමින් සහ ප්‍රතිසංස්කරණය කරමින් බලාපොරොත්තු වූයේ ස්වදේශිකයන්ගේ හරයන්ට ගැලපෙන පරිදි සමාගමේහි පාලනය සමපාත කිරීමටය."

*Karonchihamy v Angohamy* 8 N.L.R. 1

ඉහත ප්‍රකාශය ඇසුරෙන් ලන්දේසි යුගය තුළ බතාවියානු ව්‍යවස්ථා ශ්‍රී ලංකාව තුළ අදාල කරගත් ආකාරය පහදන්න

**(ලකුණු20)**

8) පහත සඳහන් **ඕනෑම දෙකක් (02)** සඳහා කෙටි සටහන් ලියන්න.

(අ) 1833 - 1947 දක්වා ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීම.

(ආ) උඩරට නීතියේ සමකාලීන වර්ධනයන්

(ඇ) පූර්ව යටත් විජිත යුගය තුළ යුක්තිය පසිඳලීම

(ඈ) නිදහසින් පසු කාලය තුළ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ වූ ප්‍රධාන වෙනස්කම්

**(ලකුණු 10x2 = 20)**

****සියලුම හිමිකම් ඇවිරිණි****